# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 අගෝස්තු/ සැප්තැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

සිංහල (නව නිර්දේශය)

සිංහල භාෂා සම්ප්‍රදාය හා කලා ශිල්ප **SINH – E 2025**

සෑම කොටසකින්ම එක් ප්‍රශ්නයක් හෝ අයත් වන සේ
ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

## I කොටස

01. 'සිංහල භාෂාව ඉන්දු ආර්ය භාෂා ගණයට අයත් වූවකි.' සසාධක ව විමසන්න.

02. සිංහල ප්‍රාකෘත අවධියෙන් හෙළිවන භාෂා ලක්ෂණ මොනවාදැ යි සනිදර්ශන ව පැහැදිලි කරන්න.

03. සිංහල භාෂා ඉතිහාසයේ ප්‍රධාන සන්ධිස්ථානයක් ලෙසට, 'මධ්‍යතන සිංහල අවධිය' හැඳින්වෙන්නේ කවර හේතු සාධක පදනම් කරගෙන දැයි පරීක්ෂා කරන්න.

නැතහොත්

නූතන සිංහල අවධියේ දී සිංහල භාෂාව මත පතිත වූ ඉංග්‍රීසි භාෂාවේ බලපෑම කෙබඳුදැ යි නිදසුන් සහිතව පරීක්ෂා කරන්න.

## II කොටස

04. 'ඇ' වර්ණය හා බින්දුව පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්, සිදත් සඟරා වර්ණමාලාව පිළිබඳ විමර්ශනයක් කරන්න.

05. සිදතේ එන ඉගැන්වීම් ඇසුරින් 'ක්‍රියාව' යනු කුමක්දැ යි පැහැදිලි කොට, ත්‍රෛකාලික ක්‍රියා පිළිබඳ විග්‍රහයක් කරන්න.

06. සිදත් සඟරාවේ එන 'සමස් අදියර' හඳුන්වා, විභක්ති සමාසයේ සියලු ප්‍රභේද නිදසුන් සහිතව විභාග කර දක්වන්න.

07. කාරක පිළිබඳ සාම්ප්‍රදායික ඉගැන්වීම් පහදා, අර්ථසම්පන්න වාක්‍ය සම්පාදනයේ දී ෂට්කාරක උපස්තම්භක වන අයුරු නිදසුන් සහිතව දක්වන්න.

## III කොටස

08. ශ්‍රී ලාංකේය කලා ඉතිහාසයේ ආරම්භය පිළිබඳ විමර්ශනයෙහි ලා ප්‍රාග් ඓතිහාසික පුරා කෘතිවලින් ලැබෙන දායකත්වය සමාලෝචනය කරන්න.

09. ශ්‍රී ලාංකේය ගෘහනිර්මාණ සම්ප්‍රදායයේ කලාත්මක විකාසනයට හා ප්‍රවර්ධනයට මහින්දාගමනය සහේතුක වූයේ කෙසේදැ යි නිදර්ශනාශ්‍රයෙන් විමසන්න.

10. 'භාරතීය ආභාසය ලැබුව ද ශ්‍රී ලාංකේය ස්තූපය නිර්මාණය වී ඇත්තේ දේශීය අනන්‍යතාවක් සහිතව ය.' මෙම ප්‍රකාශයෙහි යුක්තියුක්තතාව විභාග කරන්න.

<u>නැතහොත්</u>

සීගිරි චිත්‍ර සම්ප්‍රදාය පිළිබඳව විශ්ලේෂණාත්මක විග්‍රහයක් කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

*********************************